මාධ්‍ය තුළින් දක්නට ලැබෙන "කුඩ්ඩෝ" වැනි සෘණාත්මක ලේබල් කිරීම් දෙයාකාරයකින් ගැටළුකාරී වෙයි.

ඉන් එකක් වන්නේ සමාජයක ශිෂ්ට සම්පන්න චින්තනයක් ඇති කිරීම හෝ නැති කිරීම සඳහා භාෂාවේ ඇති බලපෑමයි. ඒ නයින් බලනා විට මෙවන් සෘණාත්මක නාමකරණයන්, වඩාත් ශිෂ්ට සම්පන්න සිතීම් රටාවක් උදෙසා ගැටළුකාරී නොවේ යැයි ඔබ සිතන්නේද?

දෙවෙනුව, මෙවන් සෘණාත්මක ලේබල්ගත කිරීම් ඔස්සේ එවන් කොටස් සමාජයෙන් වඩ වඩාත් කොන් කිරීම සිදුවේ. ඒ ඔස්සේ ඔවුන්ට දඬුවම් විඳීමකින් සහ පුනරුත්ථාපනයකින් පසුව හෝ නැවත වතාවක් ජනසමාජයේ කොටස් කරුවන් වීමට ඇති ඉඩ කඩ යම් ප්‍රමාණයකින් හෝ ඇහිරෙන්නේ නැතැයි ඔබ සිතන්නේද? ඒ ඔස්සේ මෙම සමාජ ගැටළුව නොවිසඳී ඔඩු දිවීමට ඉඩ ඇතැයි ඔබ නොසිතන්නේද?

මෙය මාධ්‍ය තුළ දැක්වෙන ආකාරයට උදාහරණයක් ලෙසට, මාර්ග අනතුරු සම්බන්ධයෙන් මව්බිම පුවත්පතේ පුවත් වාර්තාවක් සහ, හිරු ටීවී නිව්ස් පුවත් වාර්තාවක් ඉදිරිපත් වූ ආකාරය ගත හැක.

මව්බිම (පෙබරවාරි 03, 2022) : "ලයිසන්වලට මෙඩිකල් ගන්න ආ 1213කින් 145 ක් කුඩ්ඩෝ"
හිරු ප්‍රධන පුවත් (පෙබරවාරි 02, 2022): පොලිස් මාධ්‍ය ප්‍රකාශක - "...මත්ද්‍රව්‍ය ගන්න අය බවට අනාවරණය වෙලා තියෙනවා."

මේ අනුව, වඩාත් යෝග්‍ය භාෂා භාවිතය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?